**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය - 2023**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 48 ඡේදය ප්‍රකාරව, ප්‍රමිතිය මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් මෙන්ම ආදායම් හා වියදම් හිලව් නොකල යුතු වුවද, සමාලෝචිත වර්ෂය රෝහල් ගාස්තු ණයගැති ගිණුම්වල රු.මිලියන 1.71ක බැර ශේෂ රෝහල් ගාස්තු ණයගැති ගිණුම්වල හර ශේෂ වලින්ද, වෙළඳ ණයහිමියෝ හර ශේෂ රු.මිලියන 2.2ක් වෙළඳ ණයහිමි බැර ශේෂවලින්ද හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.පෙර වර්ෂවලදීද මේ පිළිබඳ කරුණු හෙළිදරව් කර තිබුණද අවශ්‍ය නිවැරදි කිරීම් කර නොතිබුණි. | ණයගැතියන් හා ණයහිමියන් සම්බන්ධව සිදු කරන ලද නිවැරදි කිරීම් සඳහා මෙම හර ශේෂ හා බැර ශේෂ හිලව් කිරීම කළ බව හා 2024 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයාගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදුවූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.මිලියන 205.26ක ශේෂයක් ඉදිරියට ගෙන ආ සමුච්චිත ඌණතාවයට ගලපා තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරිමේදි සඳහන් කර ඇති ක්‍රමවේදයට අනුව ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව. | එම |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන්, පිරිවැය රු.මිලියන | වෛද්‍ය උපකරණ සමාලෝචනය කිරීම හා ප්‍රත්‍යාගණනය කිරීම දැනට සිදු කරමින් පවතින බව හා එම අයිතම ලැයිස්තුගත කර තක්සේරු කිරීම ආරම්භ කර ඇති බව. | එම |

4,347.17ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රෝහල සතු ඉඩමේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 10.0229ක් වුවද ඉන් හෙක්ටයාර් 9.8047ක් පමණක් 2022 වර්ෂයේදී රු.මිලියන 4,845.5කට ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර හෙක්ටයාර් 0.2182ක භූමි ප්‍රමාණයක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මෙම රෝහලට අයත් ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් බව පෙනී ගිය හෙයින් සම්පූර්ණ පවරා ගැනීම් කටයුතු නිම වූ පසුව ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව. | සම්පූර්ණ ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ රෝහල් බිල්පත්වල වැරදි නිවැරදිකිරීම සඳහා යොදන ලද එකතුව රු.මිලියන 4.95ක් හා රු.මිලියන 31.12ක් වූ පිළිවෙලින් හරපත් හා බැරපත්වල හා අගයන් අදාල ආදායම් ගිණුම්වලට ගැලපීම් කිරීම වෙනුවට රු.මිලියන 26.17ක් වූ එම ශේෂයන්හි වෙනස ආදායම් ගැලපුම් (Income Adjustment) ලෙස විවිධ වියදම් යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | බැඳුම්කර ආදායම් වැඩියෙන් දක්වා තිබීම 2024 වර්ෂයේ දී නිවැරදි කරන බව හා 2023 වර්ෂයේ අයවිය යුතු බැඳුම්කර මුදල තුළ අඩංගු පසුගිය වර්ෂවලට අදාල වැටුප් වියදම ප්‍රවර්තන වර්ෂයේ ආදායමෙන් අඩු කිරීම සඳහා බැඳුම්කර ගිණුම හර කර සමුච්චිත ලාභාලාභ ගිණුම බැර කරන ලද බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී බැඳුම්කර කඩකල හෙද නිලධාරීන් 19දෙනෙකුගෙන් ලැබියයුතු බැඳුම්කර ආදායම රු.මිලියන 33.22ක් වුවද රු.මිලියන 37.33ක් ලෙස ගිණුම්ගතකිරීම හේතුවෙන් ලැබියයුතු බැඳුම්කර ආදායම් (ජංගම වත්කම්) හා වර්ෂයේ ලාභය රු.මිලියන 4.11ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ බැඳුම්කර කඩකල හෙද නිලධාරීන් 19දෙනෙකුගෙන් අයවිය යුතු ගෙවූ වැටුප්වල එකතු අගය රු.මිලියන 31.03ක් පෙර වර්ෂ ගැලපීමක් ලෙස සලකා වැරදි ආකාරයට බැඳුම්කර ආදායම් ගිණුමට හර කර සමුච්චිත ලාභාලාභ ගිණුමට බැරකර තිබුණු අතර ඒ හේතුවෙන් වර්ෂයේ බැඳුම්කර ආදායම හා ලාභය එම වටිනාකමෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වර්ෂයේ දී ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | එම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ වෘත්තිය ගාස්තු අයකිරීම් හා ආපසු ගෙවීම් ගිණුම්ගත කිරීමේ නිශ්චිත හා නිසි ක්‍රමවේදයක් මහාරෝගාශාලා මණ්ඩලය විසින් හඳුනාගෙන නොතිබුණු අතර වෘත්තිය ගාස්තු ආදායම වූ රු.මිලියන 653.93ක් ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගිණුමට බැර කර, සමාලෝචිත වර්ෂය තුළදී මුදලින් ගෙවා තිබුණු වෘත්තිය ගාස්තු රු.මිලියන 623.94ක් එම ගිණුමට හර කර තිබුණි. 2023 දෙසැම්බර් මාසයට අදාලව ණයලිපි (Credit Letter) මත රෝහලින් බැහැරව යන රෝගීන්ගේ රෝහල් ගාස්තු හා වෘත්තීය ගාස්තු ලෙස රෝහල් ගාස්තු ආදායම් ගිණුමෙන් රු.මිලියන 62.84ක් ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගිණුමට බැර කර තිබුණි. ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගිණුමේ 1998 වර්ෂයේ සිට පවතින රු.මිලියන 3.62 ක්වූ ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම ගිණුමේ තවදුරටත් රු.මිලියන 27.72ක ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ශේෂයක් පැවතියද එම ශේෂය තහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වෘත්තීය ගාස්තු 2022 වර්ෂයේ ඔක්තෝබර් මස සිට රෝහල් බිල්පතට ඇතුලත් කර ඇති බව, 1998 වර්ෂයේ සිට පවතින ගෙවිය යුතු මුදල ඉදිරියේදි ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව හා 2023 වර්ෂයේ ගෙවීමට ඇති වෘත්තීය ගාස්තුවලට අදාල විස්තර ලබා දීමට කටයුතු කරන බව. | වෘත්තීය ගාස්තු අයකිරීම් හා ආපසු ගෙවීම් සම්බන්ධව ප්‍රතිපත්තියක් පිළියෙල කර ඒ අනුව අයකිරීම් හා ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඉ) | පෙර වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී කල්ඉකුත් වූ ඖෂධ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 9.89ක් හා රු.මිලියන 24.14ක් ලෙස එකතුව රු.මිලියන 34.03ක වෙන්කිරීමක් සිදුකර තිබුණද, කල් ඉකුත් වූ ඖෂධවලට අදාල වෙන්කිරීම් සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් රෝහල විසින් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | කල් ඉකුත් වූ ඖෂධ සඳහා වෙන් කිරීමේ ක්‍රමවේදයක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | කල් ඉකුත් වූ ඖෂධ පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල එකතුව රු.මිලියන 39.89ක් වූ විදුලිය හා ජල බිල්පත් වටිනාකම උපචිත වියදම් ලෙස ගැලපීම් නොකිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම වටිනාකමෙන් වැඩියෙන් හා ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි. | අදාල නිවැරදි කිරීම් 2024 වර්ෂයේ සිදුකර ඇති බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | දහන යන්ත්‍රයේ (Incenerator) සේවා ගිවිසුම ප්‍රකාරව 2023 ඔක්තෝබර් 01 දින සිට 2024 සැප්තැම්බර් 30 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ගෙවන ලද සේවා මුදලින් 2024 වර්ෂයට අදාල රු.මිලියන 2.17ක මුදල ඉදිරියට ගෙවීම් ලෙස හඳුනාගැනීමකින් තොරව වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | එම |

| | | | |
|---|---|---|---|
| (ඌ) | තොග සම්බන්ධ පරිගණක (Systolic) පද්ධතියේ සිදුවන භාණ්ඩ ලැබීමේ පත්‍ර (GRN) ඉවත් කිරීම් ගිණුම්කරණ පරිගණක පද්ධතිය (Accpac) තුළ යාවත්කාලීන නොවීම, ගිණුම්කරණ පරිගණක පද්ධතියේ භාණ්ඩ ලැබීමේ පත්‍ර දෙවරක් සටහන් වීම සහ අගයන් වෙනස් වී සටහන්ව තිබීම, ගිණුම්කරණ පරිගණක පද්ධතියෙන් මුදල් ගෙවීම සිදු වුවත් එම ගෙවීම් කේවල ණයහිමි ශේෂ වලට ගලපා නොතිබීම, කේවල ණයහිමි ශේෂ තුළ දඩ මුදල්, ප්‍රමාද ගාස්තු ගැලපුම් සිදුකර නොතිබීම හා කේවල ණයගැති ශේෂ වලට අදාලව මුදල් ලැබීම් නිසි පරිදි ගැලපීම් නොකිරීම යනාදී හේතු මත වෙළඳ ණයහිමි හා වෙළඳ ණයගැති ශේෂවල සිදුවී ඇති වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් වවුචර් පිළියෙල කිරීමකින් තොරව හර පත් හා බැර පත් මගින් 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ශේෂය රු.මිලියන 22.73ක් සමුච්චිත ලාභලාභ ගිණුමට ගැලපීම් කර තිබුණි. | ගිණුම් පරිගණක පද්ධතිය තුල යම් කිසි නිවැරදි කිරීම් හර පත් හා බැර පත් මගින් පමණක් සිදු කල හැකිබව හා ණයහිමි හා ණයගැති ශේෂ නිරවුල් කිරීම ජනල් වවුචර් පිළියෙල කිරීමෙන් කල නොහැකි බව. | එම |
| (එ) | ණයගැති ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව බොල් ණය සඳහා පිළිගත් ක්‍රමවේදයට අනුව සියයට 5ක් වෙන් කිරීම් කළ යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස රු.මිලියන 6.3ක් වැඩියෙන් බොල් ණය වෙන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. | 2024 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | වැඩහල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව ගෙවන ලද වැඩ පූර්ව අත්තිකාරම් රු.මිලියන 7.11ක් අත්තිකාරම් ලෙස නොදක්වා මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා තිබුණි | මෙය ඉදිරිපත් කිරීමේ දෝෂයක් බව හා 2024 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | එම |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලද එකතුව රු.මිලියන 3.12ක් වූ වෛද්‍ය උපකරණ, ලී බඩු හා සවිකිරීම් අගය පරිත්‍යාග ගිණුමට බැර කිරීම වෙනුවට ණයහිමි ශේෂයක් ලෙස දැක්වීම හේතුවෙන් පරිත්‍යාග එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ දි නිවැරදි කිරිමට කටයුතු කරන බව. | එම |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ,රෝහල් ගාස්තු ණය ගැතියෝ හා ව්‍යාධිවේදී රසායනාගාර අත්තිකාරම් යන විෂයයන් 03කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා විගණනයට ඉදිරිපත් | මෙම වෙනස්කම්වලට අදාල හේතු සොයා නිවැරදි කිරිමට කටයුතු කරන බව හා ඉදිරියේ දී මෙවැනි වැරදීම් සිදු | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් දත්ත අදාල උපලේඛන, ලැයිස්තු සහ පරිගණක වාර්තා |

| | | |
|---|---|---|
| කළ ලිපිගොනු හා ලේඛන අනුව වටිනාකම අතර රු.මිලියන 56.77 වෙනසක්වූ අතර එම වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි. | නොවීමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දුන් බව. | සමඟ ගැලපිය යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 1,899.55ක් වූ ණයහිමියෝ, රෝහල් ගාස්තු ණය ගැතියෝ හා සේවා ගාස්තු යන ගිණුම් විෂයයන් 03ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් සහ උපයෝගී ලේඛන ආදී සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීම හෝ සන්නිරීක්ෂණය කිරීම හෝ විගණනයේදී පිළිගැනීමට නොහැකි විය. | ගිණුම්කරණ පද්ධතියට අනුව ලබා ගත හැකි ණයගැති හා ණයහිමි කාල විශ්ලේෂණය විගණනය සඳහා ලබා දී ඇති බව හා පද්ධතියට අදාල Source code නොමැති බැවින් සම්මත ආකෘති වෙනස් කල නොහැකි බව හා එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සොයා ගැනීම අපහසු වී ඇති බව හා වෘත්තීය ගාස්තු වලින් සියයට 0.15 ක් පමණක් රෝහල් සේවා ගාස්තු ලෙස අයකර ගැනීමට නැවත අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බව. | කාල විශ්ලේෂණ, උපයෝගී ලේඛණ සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යනාදී සනාථ කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ හා වර්ෂ 01 සිට වර්ෂ 05ක කාලයක් තුල ගිවිසුම් කඩකරමින් බැඳුම්කර නොගෙවා සේවය අතහැර ගොස් තිබුණු නිලධාරින් 26දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 43.22ක බැඳුම්කර මුදල් අයකර ගැනීමේ කටයුතු මන්දගාමී තත්ත්වයක පැවතුණි. | ගිවිසුම් කඩකල හෙද නිලධාරින්ගේ ගිවිසුම් ප්‍රකාර බැඳුම්කර අයකර ගැනීමට නීති නිලධාරි වෙත දන්වා නිතිමය පියවර ගෙන ඇති බව. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සේවය අත්හිටවූ , සේවය අතහැර ගිය හා විදේශගත වූ සේවකයින්ගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 5.68ක්වූ ආපදා ණය ශේෂය මෙතෙක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණු අතර මෙම මුදලින් රු.මිලියන 5.12ක් වර්ෂ 2 සිට 7 දක්වා වූ කාල පරාසයක සිට පැවතෙන ශේෂ විය. | අයවිය යුතු ණය ශේෂයන් පිළිබඳව තොරතුරු ලබා ගෙන ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ එසේ නොහැකි ඒවා පිළිබඳව නඩු පැවරීමට කටයුතු කරන බව. | එම |

### 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| II පරිච්ඡේදයේ 2.1 හා 2.2 සිට 2.6 දක්වා වූ වගන්ති | කාර්ය මණ්ඩලයේ සෑම සේවයක හා ශ්‍රේණියක තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, තනතුරෙහි වැටුප් පරිමාණය, වයස් සීමාව සහ අදාළ අනෙකුත් විස්තර ඇතුළත්කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු වුවද,මේ දක්වාම බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටි අනුමත කිරීමට යාමේදී මෙම තනතුරු නාම සහ වැටුප් කේතවල වෙනස්කම් ඇති බව නිරීක්ෂණය වූ බැවින් එම වැටුප් කේතයන් නිවැරදි කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා ඇතිබව හා බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමට පත් කල කමිටුව විසින් මේ වන විටත් බඳවා ගැනීමේ පටිපාටි කෙටුම්පත් සකසා අවසන් වී ඇති බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 103 සහ 104 වගන්ති | වාහන අනතුරු හේතුවෙන් සිදුවන අලාභ සම්බන්ධයෙන් ඊට වගකිවයුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ පැවැත්විය යුතු වුවද රෝහලේ වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් ඊට අදාල වගකිවයුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ පවත්වමින් සිටින බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 110 | සෑම ආයතනයක් විසින්ම සිදුවන හානි වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ආකෘතිය ප්‍රකාරව හානි ලේඛනයක් පවත්වා ගත යුතු වුවද රෝහලේ වාහන සම්බන්ධයෙන් නිසි ආකෘතිය පරිදි සකස්කල හානි ලේඛනයක් පවත්වා නොතිබුණි. | මු.රෙ. 110 ප්‍රකාරව හානි ලේඛනය ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතින බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |
| | (iii) මුදල් රෙගුලාසි 1642 | ආයතනයේ වාහන භාවිතා කරනු ලබන නිළධාරීන් විසින් හෝ ඔවුන් නොමැති අවස්ථාවන්හිදී ඒ වාහනවල රියදුරන් විසින් සිදුවන සියළුම හදිසි අනතුරු සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඇතැම් වාහන අනතුරු සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කර ඇතත් අතපසු වීමකින් අදාල ලිපි ගොනු විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බව හා මේ වන විට සියළුම වාහන අනතුරු සම්බන්ධව පොලිසියට වාර්තා කරන බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කරමින් පවතින බව හා ජීව වෛද්‍ය උපකරණ ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරන බව. | භාණ්ඩාගාර චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 ඔක්තෝබර් 10 දිනැති අංක DMS-1758/Vol.1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන යෝජනා සකස්කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද, ඒ අනුව කටයුතුකර නොතිබුණි. | වැටුප් පරිමාණ 61ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යැවීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව හා ඉතිරි වැටුප් පරිමාණ 13 සඳහා කෙටුම්පත් බඳවාගැනීමේ පටිපාටි සකසා අවසන්වී ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණු වහාම, නිර්දේශ කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කරන බව. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 303.77ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 247.23ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 56.54 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 943.51 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රෝහල විසින් 2022 ඔක්තෝබර් සිට ගෙවන වාට්ටුවල කාමර ගාස්තු සඳහා එකතු කල අගය මත බදු ලෙස සියයට 15 ක බදු ප්‍රතිශතයක් රෝගීන්ගේ බිල්පත්වලින් අයකර තිබුණි.මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය. | | |
| | (i) 2022 ඔක්තෝබර් සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එකතු කල අගය මත බදු ලෙස අයකල රු.මිලියන 21.21ක් සම්බන්ධයෙන් 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 3 පරිච්ඡේදයේ 21 වගන්තිය පරිදි කාර්තුමය වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාල කාර්තුමය වාර්තා දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව. | 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | (ii) රෝහලේ ගෙවන වාට්ටුවල කාමර ගාස්තු සඳහා පමණක් එකතු කල අගය මත බදු අයකර තිබුණද පනතේ විධිවිධානවලට අනුව එම ආදායමෙන් ඊට අදාලව ගෙවන ලද එකතු කල අගය මත බදු පමණක් හිලව් කරගැනීමෙන් තොරව අයකල සම්පූර්ණ බදු මුදලම ගෙවූ බදුවලට හිලව් කරගෙන තිබුණි. | රෝහලේ කාමර ගාස්තු මත පමණක් එකතු කල අගය මත බදු අය කරනු ලැබුවත් එම කාමරවලට අදාල වියදම් වෙනම හඳුනා ගැනීම දුෂ්කර කාර්යයක් බැවින් අය කල සම්පූර්ණ බදු මුදල් ගෙවූ බදුවලට හිලව් කිරීමට කටයුතු කල බව. | එම |
| | (iii) 2016, 2017 හා 2018 වර්ෂයන්හිදී යථෝක්ත පනතේ 26 වගන්තියට අනුකූල නොවීම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවා තිබුණු එකතුව රු.මිලියන 5.2 ක දඩ මුදල සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කර තිබුණද එම දඩ මුදල නිදහස් කල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මේ පිළිබඳව සොයා බලා හැකි ඉක්මනින් විගණන අංශය දැනුවත් කිරීමට කටයුතු කරන බව. | එම |
| (ආ) | 2021,2022 හා 2023 වර්ෂ තුළ වෘත්තිය ගාස්තු ලෙස ගෙවන වාට්ටුවලට අදාලව වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය වෙත ගෙවූ මුදල හා එම වාට්ටුවලින් රෝහල වෙත ලැබුණු ආදායම පිළිවෙලින් රු. මිලියන 648.3 ක්, 857.5 ක් හා 1,111.6 වී තිබුණු අතර ඒසම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය. | | |
| | (i) රෝහලේ සම්පත් යොදාගෙන රාජකාරී වේලාවෙන් පරිභාහිරව කරන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා සම්මත ප්‍රමිතියකින් හෝ | අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වෘත්තීය ගාස්තු නියාමනය කිරීම සඳහා | රාජකාරී වේලාවෙන් පරිභාහිරව කරන ශල්‍යකර්ම හා |

| | | | |
|---|---|---|---|
| | නිශ්චිත ප්‍රතිපත්තියකින් තොරව විශේෂඥ වෛද්‍යවරුන්ගේ අභිමතය පරිදි අයකරන ගාස්තු තීරණය කර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව බිල්පත් වටිනාකමෙන් සියයට 24 සිට සියයට 89 දක්වා වූ පරාසයක වෘත්තීය ගාස්තු අයකර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇති බව හා ඉදිරියේදී එම කමිටු වාර්තාව අනුව කටයුතු කරන බව. | පරීක්ෂණ සඳහා සම්මත ප්‍රමිතීන් අනුව සකස් කළ අයකිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ii) | වෛද්‍ය නිලධාරීන් විසින් නිවාඩු දින දීමනා ලබාගත් කාලසීමාව තුළ පෞද්ගලික සේවයේ යෙදී වෘත්තිය දීමනාද අයකර තිබුණු අතර නියැදි විගණන පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂය තුළ වෛද්‍ය නිලධාරීන් 07 දෙනෙකු විසින් එසේ වෘත්තිය දීමනා ලෙස අයකර තිබුණු මුදල රු.මිලියන 1.52ක් විය. | එවැනි වැරදි යළි ඇති නොවන ආකාරයෙන් ශල්‍යාගාරය, පාලන අංශය හා ගිණුම් අංශය අතර සෘජු සම්බන්ධීකරණ ක්‍රමවේදයක් අනුගමනය කරමින් ගෙවීමට පෙර විධිමත් පරීක්ෂාවකට ලක් කිරීමට කටයුතු කර ඇති බව. | මෙම මුදල් රෝහල් ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | 1984 ජූලි 18 දිනැති අංක අමප/1984/335(2) දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ 2000 නොවැම්බර් 15 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සාමාන්‍ය රාජකාරී වේලාව තුළ ගෙවන වාට්ටුවල රෝගීන් සඳහා සිදුකරන ශල්‍යකර්ම වෙනුවෙන් වෘත්තීය ගාස්තු අය කළ නොහැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව එසේ වෘත්තීය ගාස්තු ලෙස අය කර තිබුණු මුදල රු.මිලියන 4.91ක් විය. | ශල්‍යාගාරය සහ ගිණුම් අංශය අතර සෘජු සම්බන්ධීකරණ ක්‍රමවේදයක් සකස් කොට මෙම කටයුතු නියාමනය කිරීම ආරම්භ කොට ඇති බව. | අමාත්‍ය මණ්ඩල තීරණය හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතුය. |
| (iv) | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත සහායක වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා 2023 වර්ෂයේදී වෘත්තීය ගාස්තු ලෙස රු.මිලියන 60.73ක් ගෙවා තිබුණි. | වෘත්තීය ගාස්තු නියාමනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇති බව හා ඉදිරියේදී එම කමිටු වාර්තාව අනුව කටයුතු කරන බව. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. |
| (v) | රෝහල තුළ පෞද්ගලික සේවයේ යෙදවීමට හා වෘත්තීය ගාස්තු අයකිරීමට නිසි අනුමැතියකින් තොරව හා විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රෝහල් කාර්යමණ්ඩලය තුළ නොවන බාහිර වෛද්‍යවරුන් 08 දෙනෙකු රෝහලේ සම්පත් භාවිතා කරමින් ශල්‍යකර්ම සිදු කර වෘත්තීය ගාස්තු ලෙස එකතුව රු.මිලියන 11.98ක් රෝගීන්ගෙන් අය කර තිබුණු අතර ඉන් රෝහල වෙත සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් ගෙවා තිබුණි . | කළමනාකරණ වියදමක් ලෙස සේවා ගාස්තු අයකරගත්තද, වැයවෙන අනෙකුත් වියදම් සියයට 30 ලාභාන්තිකයක් සහිතව රෝගියාගෙන් අයකරගන්නා බව හා එම වෛද්‍යවරුන්ට රෝගීන් ඇතුලත් කල හැක්කේ රෝහලේ ස්ථිර විශේෂඥ වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ පමණක් බව. | බාහිර වෛද්‍යවරුන්ගේ සේවය ලබා ගැනීමේදී සුදුසු අනුමැතීන් ලබාගත යුතු අතර වගකීම් පිළිබඳ ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | 2023 වර්ෂය තුළදී කාර්යමණ්ඩලය වෙත ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තු රු.මිලියන 601.74කින් මණ්ඩලයේ ආදායමට බැරකර තිබුණු මුළු සේවා ගාස්තුව රු.945,345ක් පමණක් විය. 1999 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවත්නා වෘත්තිය ගාස්තුවෙන් සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අයකර ගැනීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් විගණනයට ඉදිරිපත් නොවුණු අතර කාලානුරූපීව අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීමට රෝහල් පාලනාධිකාරිය කටයුතු කර නොතිබුණි. | එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සොයා ගැනීම අපහසු වී ඇතිබව, වෘත්තීය ගාස්තු වලින් සියයට 0.15 ක් පමණක් රෝහල් සේවා ගාස්තු අයකර ගැනීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලද බව හා ගාස්තු එම අගයේම තැබීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බව. | රෝහල විසින් වෘත්තීය ගාස්තු වෙනුවෙන් දරන පරිපාලන වියදම් අයකර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (vii) | රෝහල විසින් වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා ගෙවනු ලබන වෘත්තිය ගාස්තු මත උපයන විට ගෙවීම් බදු අඩු කිරීමකින් තොරව 2023 ජුනි 08 දිනැති අංක S.B.M 1.4 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව 2022 දෙසැම්බර් 22 දිනැති අංක SEC/2022/E/03 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය පදනම් කරගෙන රු 100,000 .කට වැඩි වෘත්තිය ගාස්තු ගෙවීම් මත 2023 ජනවාරි මාසයේ සිට සියයට 5ක රඳවා ගැනීමේ බද්දක් පමණක් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. එහෙත් රෝහලේ අභියාචනාවකට අදාලව බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2024 අප්‍රේල් 10 දිනැතිව ලබාදී තිබුණු වාර්තාව අනුව වෘත්තිය ගාස්තු මත උපයන විට බදු ගෙවිය යුතු බවට රෝහල වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව 2013/2014 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රෝහලේ වෛද්‍ය හා අනෙකුත් කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද වෘත්තිය ගාස්තු මත උපයන විට බදු ගණනය කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ප්‍රේෂණය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව වෘත්තීය ගාස්තු මත උපයන විට බදු අය කිරීම ක්‍රමවත් කිරීමට කටයුතු කරන බව. | බදු අභියාචනා කොමිසමේ තීරණය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1996 ජුලි 17 දිනැති අංක 96/1347/120/143 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ විවිධ ශ්‍රේණි සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සමාන්තර ශ්‍රේණි හෝ අනෙකුත් දෙපාර්තමේන්තුවල සමාන්තර තනතුරු අතර වැටුප් පරතරය සියයට 35 ක්වන අයුරින් පවත්වා ගැනීම පොදු ප්‍රතිපත්තියක් ලෙස තීරණය කර තිබුණි. මෙම වැටුප් වැඩිවීම පදනම් කරගෙන 2018 මාර්තු 15 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ යටතේ වෛද්‍ය, හෙද හා | සෞඛ්‍ය අමාත්‍යාංශයේ පොදු චක්‍ර ලේඛ යටතේ වෛද්‍ය, හෙද හා පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන් වෙත ගෙවීම් කරනු ලබන අතිරේක රාජකාරී දීමනා සහ අතිකාල දීමනා සඳහා 35% ක් එකතු කර ගෙවීම සඳහා 2018 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය කර ඇත්තේ ශ්‍රී | අදාල අධිකාරී අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන් වෙත ගෙවීම් කරනු ලබන අතිරේක රාජකාරි දීමනා හා අතිකාල දීමනා සඳහා 2018 ජනවාරි 01 දින සිට බලාත්මක වන පරිදි සියයට 35 වැඩිවීම චක්‍රලේඛයේ සඳහන් රේටයට එකතු කර ගෙවීමට තීරණය කර තිබුණි. ඒ අනුව රෝහලේ වෛද්‍ය කාර්යමණ්ඩලය හෙද හා පරිපූරක වෛද්‍ය සේවයේ කාර්යමණ්ඩලය වෙත චක්‍රලේඛයේ සඳහන් අතිරේක රාජකාරි හා අතිකාල දීමනාවට සියයට 35ක් එකතු කර චක්‍රලේඛය මගින් ලබාදෙන දීමනාවට වඩා ඉහළ රේට් අගයක පිහිටුවා පිළිවෙලින් 2021, 2022 හා 2023 වර්ෂවලදී රු.මිලියන 168.43ක්, රු.මිලියන 162.47ක්හා රු.මිලියන 158.07ක් ලෙස ගෙවීම්කර තිබුණි. මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබා තිබුණු බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ජයවර්ධනපුර මහ රෝහල් පනතේ අංක 07 ඡේදයේ 2(C) වගන්තිය යටතේ රෝහල් මණ්ඩලයට ඇති බලතල අනුව බව. | |
| (ඇ) | මහාරෝග්‍යශාලා මණ්ඩලයේ පවතින රෝහල් ගාස්තු බිල්පත් හා තොග සම්බන්ධ (Systolic) පරිගණක පද්ධතියේ තොරතුරු ගිණුම්කරණ පරිගණක පද්ධතියට (Accpac) ඇතුළත් කිරීමෙන් පසු සිදුවන වෙනස්කම් නැවත ගිණුම්කරණ පද්ධතිය තුළ යාවත්කාලීන නොවීම හේතුවෙන් පද්ධතිය තුළ පවතින ගැණුම් පිරිවැය, ණයහිමියෝ, ණයගැතියෝ සහ රෝහල් ගාස්තු ආදායම යන අයිතමයන්හි අගයන් වෙනස්වීම මෙන්ම එකම පද්ධතිය තුළ (Systolic) වෙනස් දිනයන්හි ශේෂ වෙනස්වීම් නිරීක්ෂණය වූයෙන් එම අයිතමයන්හි නිවැරදි අගයන් මූලා ප්‍රකාශනවලින් නිරූපනය වන්නේද යන්න මතභේදයට තුඩුදෙන කරුණක් විය. රෝහලේ පවතින පරිගණක පද්ධති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් (System link) ඇතිකර නොතිබීම, පරිගණක පද්ධතියේ දත්ත ඇතුළත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාළ ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක නොවීම මීට හේතු වී තිබුණි. | තොග සම්බන්ධ (Systolic) පද්ධතියේ පවතින මෙම ගැටළුව සම්බන්ධව අදාල ආයතනය වෙත දැනුම් දීමට කටයුතු කරන බව හා කාලීන වාර්තා වල එකතුව පසු කාලීනව වෙනස් වීම පිළිබඳව අදාල ආයතනය සමඟ සොයා බැලීමට කටයුතු කරන බව. | පරිගණක පද්ධති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ඇතිකිරීම හා දත්ත ඇතුළත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාළ ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රෝගීන්ගේ රෝහල් බිල්පත් සඳහා මුදල් අයවීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | නිශ්චිත පදනමකින් තොරව ඉහළ කළමණාකාරිත්වයේ අනුමැතීන් මත ඇතැම් රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ගෙවීම්වලින් නිදහස් කර තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එකතුව රු.මිලියන 28.82ක බිල්පත් නිදහස් කර තිබුණු අතර 2017 වර්ෂයේදී බැරපත් මගින් මෙම ගිණුම්වලින් එකතුව රු.මිලියන 6.4ක බිල්පත් ඉවත්කිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | හදිසියේ රෝහලට රැගෙන එන රෝගියෙකුගේ ජීවිත ආරක්ෂාව සඳහා සිදු කරන හදිසි ප්‍රතිකාර සඳහා අදාල රෝගියාට මුදල් ගෙවීමේ හැකියාව නොමැති නම් එම ගාස්තු, මොළය මිය ගිය රෝගීයෙකුගේ අවයව ලබා ගන්නා තුරු දැරීමට සිදුවන ගාස්තු හා අක්මාව බද්ධ කිරීම කරනු ලබන මුල් රෝගීන් කීපදෙනෙකු සඳහා අදාල වන ගාස්තු නිදහස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ගෙන ඇතිබව, විගණන වාර්තාවෙහි සඳහන් වන ආකාරයේ සියලු බිල්පත් නිදහස් කිරීම් මේ වනවිට නැවැත්වීමට කටයුතු කර ඇතිබව හා එම නිදහස් කර ඇති ගාස්තු පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙසට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විමර්ශණ අංශය වෙත යොමු කර ඇතිබව. | ගාස්තු නිදහස් කිරීමට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |
| (ii) | රෝහල් ගාස්තු බිල්පත් නොගෙවා රෝහලෙන් බැහැරවූ රෝගීන්ගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 23.07ක ණයගැති ශේෂයක් පැවති අතර මෙම බිල්පත්වල වටිනාකම රු.360 සිට රු.මිලියන 2.04 දක්වා වූ පරාසයක විය. රෝගීන් රෝහලෙන් බැහැරවයාමේදී රෝහල් ගාස්තු අයකර නොතිබීමට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි. | 2020 වර්ෂයේ සිට නීතිමය ලියවිල්ලකට රෝගියාගේ පාර්ශවයේ අත්සන් ගන්නා බව හා රෝහල් ගාස්තු නොගෙවා යන රෝගීන් සම්බන්ධව නීතිමය කටයුතු කිරීමට රෝහල් පොලිසියට දැන්වීම සිදු කරනු ලබන බව. | රෝගීන්ගෙන් අයවිය යුතු රෝහල් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (iii) | තොග හා බිල්පත් පිළිබඳ (Systolic) පරිගණක පද්ධතියේ තොරතුරුවලට අනුව ප්‍රතිකාර ගෙන රෝහලින් බැහැරව ගිය එහෙත් බිල්පත් පියවා නොතිබුණු රෝගීන් 22 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 2.05ක රෝහල් ගාස්තු බිල්පත් පැවති අතර බිල්පත් නොගෙවා රෝගීන් රෝහලින් බැහැරවී තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය. | එම | රෝගීන්ගෙන් අයවිය යුතු රෝහල් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | රෝහලින් බැහැරව ගිය එහෙත් අවසාන බිල්පතක් සකස්කර නොතිබුණු රෝගීන් 08 දෙනෙකුට පරිගණක පද්ධතිය තුළ දෛනිකව බිල් සැකසෙමින් පැවති අතර 2024 මැයි 03 දින වනවිට එම බිල්පත්වල එකතු අගය රු.මිලියන 35.72ක් විය. මෙම රෝගීන් හඳුනාගෙන රෝගී සත්කාර වෙනුවෙන් අයවිය යුතු රෝහල් ගාස්තු අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා පරිගණක පද්ධතියෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව | රෝගීන්ගෙන් අයවිය යුතු රෝහල් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (v) | ණය ලිපි (Credit Letters) ඉදිරිපත් කර රෝහලින් බැහැරව ගිය රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් අදාල රක්ෂණ ආයතන හෝ සේවා ආයතන වෙතින් ප්‍රතිපූර්ණය නොවීමෙන් ආයතන 09කින් අයවිය යුතු රු. මිලියනය ඉක්මවූ දින 90කට වැඩිකාලයක සිට පැවතෙන එකතුව රු.මිලියන 29.62ක ණයගැති ශේෂයක් පැවතුණි. | සමහර රක්ෂණ ආයතන වලින් රෝහල් ගාස්තු ලැබීම ප්‍රමාද වන බව පිළිගන්නා බව හා මේ පිළිබඳව ඉක්මනින් පියවර ගැනීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන බව. | කඩිනමින් මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 නොවැම්බර් 03 දින රු.මිලියන 23.54ක වැට් සහිත මුදලකට පෞද්ගලික ආයතනයක් වෙතින් මිලදී ගෙන තිබුණු සායනික අපද්‍රව්‍ය පිළිස්සීමේ යන්ත්‍රය (Incinerator) වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ නඩත්තු සේවා සහ ඉන්ධන හා විදුලිය වෙනුවෙන් එකතුව රු.මිලියන 22.9ක් ගෙවා තිබුණු අතර ජලය සඳහා වැයකල මුදල වෙන්කර හඳුනාගත නොහැකි විය. මෙමගින් දෛනිකව සායනික අපද්‍රව්‍ය කි.ග්‍රෑ. 300 ත් 400 ත් අතර ප්‍රමාණයක් පිළිස්සීම සිදු කරන බව දක්වා තිබුණද සත්‍ය වශයෙන් පුළුස්සන ප්‍රමාණයන් පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් නොවිණි. මෙම යන්ත්‍රය උපයෝජනය හා නඩත්තු කටයුතු පිළිබඳ පරික්ෂාවේදී පහත කරුණු අනාවරණය විය. | | |
| (i) | යන්ත්‍රය මිලදී ගැනීමේදී නඩත්තු සේවා ගිවිසුමකින් තොරව යන්ත්‍රය පමණක් මිලදීගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබියදී යන්ත්‍රයේ අවුරුදු දෙකක වගකීම් කාලය ඉකුත් වීමෙන් පසු යන්ත්‍රය මිලදීගත් ආයතනය සමඟ නඩත්තු සේවා ගිවිසුමකට එළඹී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට අවස්ථා 03කදී එකතුව රු.මිලියන 6.91ක් සේවා ගාස්තු ලෙස ගෙවා තිබුණි. | යන්ත්‍රයේ පිරිවැය පමණක් පදනම් කර තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබා දී ඇති බව, රෝහල විසින් සේවා කටයුතු සිදුකල යුතු වුවත් සුදුසු සේවා කණ්ඩායමක් පුහුණුකර නොතිබීමත්, සේවක අඩුපාඩු හේතුවෙන් නඩත්තු කටයුතු නිසියාකාරව සිදුකල නොහැකි බව ජීව වෛද්‍ය ඉංජිනේරුවරයා දන්වා තිබීමත් මත මූලික ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන් වලට පරිබාහිර මිළ ගණන් යටතේ ගිවිසුම්ගතවීමට සිදුවූ බව | යන්ත්‍ර පිරිවැය ගණනය කිරීමේදී නඩත්තු සේවා පිරිවැය පිළිබඳ ඇගයීමකට ලක්කල යුතු අතර රෝහලට අවාසි දායක නොවන පරිදි තාක්ෂණික කමිටු තීරණ ගත යුතුය. |
| (ii) | නඩත්තු සේවා සඳහා සැලකිය යුතු මුදලක් වැයකර තිබුණද යන්ත්‍රය මගින් සායනික අපද්‍රව්‍ය නිසි පරිදි පූර්ණ දහනයකට ලක් නොවන බව නිරීක්ෂණය විය. | දහන යන්ත්‍රයේ දෝෂ වාර්තාවන අවස්ථා වලදී කීප වතාවක්ම අදාල ආයතනය මඟින් අළුත්වැඩියා | අළුත්වැඩියාව න් අප්‍රමාදව සිදු කරවාගැනීමට |

| | | |
|---|---|---|
| මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර ආරක්ෂණ බලපත්‍රය 2023 නොවැම්බර් 23 දින කල් ඉකුත්ව තිබුණද නඩත්තු සේවා ආයතනය විසින් අත්‍යවශ්‍ය අළුත්වැඩියාවන් අප්‍රමාදව සිදු නොකිරීමෙන් ඊට අදාල දුම් සහතිකය ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් බලපත්‍රය අළුත් කරවාගැනීම ප්‍රමාදවී තිබුණි. | කරන ලද බව, ලැබීමට නියමිත ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ යන්ත්‍රය පරීක්ෂා කිරීමේ වාර්තාව මගින් දෝෂ හා අළුත්වැඩියාව පිළිබඳ නිර්දේශ ලැබුණු පසු සේවා සපයන ආයතනය මගින් අළුත්වැඩියා කර ගැනිමටත්, පරිසර ආරක්ෂණ බලපත්‍රය හා දුම් සහතිකය ලබා ගැනීමටත් කටයුතු කරන බව. | කටයුතු කළ යුතුය |
| (iii)2022/2023 වර්ෂයට අදාල කල් ඉකුත් වූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ 4.7 හා 4.8 වගන්ති ප්‍රකාරව දහනය වූ අළු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. විගණනය විසින් සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී එම අළු අතර අර්ධ වශයෙන් දහනය වූ සායනික අපද්‍රව්‍ය පැවති බව නිරීක්ෂණය වූ අතර එම අළු පරිසරයට හානිදායක වන අයුරින් විවෘත පරිසරයේ ගොඩගසා තිබීමෙන් වර්ෂා කාලයේදී අවට ඇති ජල මූලාශ්‍රවලට එකතුවීමේ අවධානමක් පැවතුණි .එසේම මධ්‍යම පරිසර අධිකාරිය විසින් කරන ලද දැනුම්දීමට අනුව උපද්‍රවකාරී අපද්‍රව්‍ය (Hazardous Waste) කළමනාකරණයට අදාලව අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම යන්ත්‍රය අලුත්වැඩියා කර ගැනීමෙන් පසුව සායනික අපද්‍රව්‍යවල පූර්ණ දහනයක් අපේක්ෂා කරන බව, උපද්‍රවකාරී අපද්‍රව්‍ය (Hazardous Waste) කළමනාකරණ බලපත්‍රයද ලබා ගනිමින් ඉදිරියේදී මෙම දහන යන්ත්‍රය මගින් ඉවත් කරන අළු මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ පරිසරයට හානියක් නොවන අයුරින් බැහැර කිරීම සිදු කරන බව. | පරිසරයට හානිදායක නොවන අයුරින් අපද්‍රව්‍ය බැහැර කිරීමට නිසි වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |
| (ඇ) කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන ආයතනවල කුලී ආදායම පරීක්ෂා කිරීමේ දී පහත කරුණු අනාවරණය විය. | | |
| (i) රෝහල් පරිශ්‍රය තුළ කුලී පදනම මත ව්‍යාපාර කටයුතු පවත්වා ගෙනයන හැටන් නැෂනල් බැංකුව හා මහජන බැංකුව වෙතින් පිළිවෙලින් මාසිකව රු.45,000 ක් හා රු.15,000ක් ලෙස බදු කුලී අයකරගෙන තිබුණද දෙපාර්ශවය අතර ඊට අදාලව ගිවිසුම් ඇතිකරගෙන නොතිබුණි. | හැටන් නැෂනල් බැංකුව හා මහජන බැංකුව සමඟ කුලී ගිවිසුමකට එළඹීමට කටයුතු කරන බව. | කඩිනමින් ගිවිසුම් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 2006 වර්ෂයේදී රෝහලේ ස්ථාපනය කර තිබුණු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සමඟ ඇතිකර ගෙන තිබුණු අවබෝධතා ගිවිසුමෙහි කාලානුරූපව කුලී මුදල් වැඩිකරවා ගැනීමට හා නව ගිවිසුම් ඇතිකර ගැනීමට අවශ්‍ය කොන්දේසි ඇතුළත් කර නොතිබීමෙන් 2006 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වාම රෝහල විසින් මාසික කුලී ලෙස රු.85,000 ක් හා 2018 වර්ෂයේ සිට රු.120,000 ක් ලෙස මාසික කුලී අයකර තිබුණි. 2023 ජුනි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් මාසික කුලිය රු.150,000 දක්වා වැඩිකිරීමටත් නව ගිවිසුමක් ඇතිකරගැනීමටත් තීරණය කර තිබුණද, කුලී | ඉදිරියේදී තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට හා ඔසුසල සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් ගිවිසුම් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| මුදල් තීරණය කිරීමට අදාලව තක්සේරු වාර්තා ලබාගැනීමට හා නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. | | |
| (iii) ආහාර අලෙවිසැල් විසින් පරිහරණය කරනු ලබන ජලය වෙනුවෙන් ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව ගාස්තුවක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වෙළඳසැල් වලට ජල මීටර් සවිකර ඉදිරියේදී ජලය පරිභෝජනය සඳහා මුදලක් අය කිරීමට කටයුතු කරන බව. | ගිවිසුම්වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක රෝහලේ සමස්ත කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත කරුණුඅනාවරණය විය. | | |
| (i) 2019 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ රෝහලේ ඇඳන් සංඛ්‍යාව සියයට 5.3 කින් හා ඇඳන් භාවිතය සියයට 10 කින් අඩු වී තිබුණි. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ ඇඳන් සංඛ්‍යාව නොවෙනස්ව පැවති අතර, ඇඳන් භාවිතය සියයට 4 කින් වැඩි වී තිබුණි. | ඇඳන් භාවිතය සියයට 59 ක පමණ පවතින බැවින් ඇඳන් සංඛ්‍යාව අඩු වීම, රෝගී සත්කාරය සඳහා බලපෑමක් වී නොමැති බව හා 2019 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ ඇඳන් භාවිතය සියයට 10 කින් අඩුවී ඇතත් 2019 වර්ෂයෙන් පසු කොවිඩ් වසංගත තත්වය හමුවේ රෝගීන් ඇතුළත්වීම පහල යාමක් සිදුවූ බැවින් එම තත්වයට මුහුණ දෙමින් 2020 වර්ෂයේ සිට 2023 දක්වා ඇඳන් භාවිත අනුපාතය 52%, 54%, 55%, 59% වශයෙන් අඛණ්ඩ වර්ධනයක් රඳවා ගැනීමට කළමණාකාරිත්වය කටයුතු කර ඇති බව. | රෝහල වෙත රෝගීන් පැමිණීම් වර්ධනය කළ හැකි වැඩපිළිවෙලක් හඳුන්වාදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ රෝහලට ඇතුළත් වූ රෝගීන් සංඛ්‍යාව, සායන සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව හා බාහිර රෝගී අංශයට පැමිණි රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 17, 11 හා 30 කින් වර්ධනය වී තිබුණි. | රෝහලට ඇතුළත් වූ රෝගීන් සංඛ්‍යාව, සායන සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව හා බාහිර රෝගී අංශයට පැමිණි රෝගීන් සංඛ්‍යාව වර්ධනය වී ඇත. | එම |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත ස්ථිර වශයෙන් නිලධාරියෙකු පත්කරනතෙක් රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා නිත්‍ය තනතුරේ වැටුපෙන් ¼ ක රාජකාරී ආවරණය කිරීමේ දීමනාවක් ගෙවීමට යටත්ව වැඩ ආවරණය කිරීමේ පදනම මත 2021 ජුලි 28 දින සිට නිලධාරියෙකු පත්කර තිබුණි. එම නිලධාරියාගේ වැටුප් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ගෙවනු ලබන බවටත් රාජකාරී ආවරණය කිරීමට අදාලව දීමනා පමණක් රෝහල මගින් ගෙවීමටත් තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය. | | |

| | | |
|---|---|---|
| (i) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.7 වගන්තියට අනුව වැඩ ආවරණය කිරීමේ පත්කිරීමකට අදාලව අතිරේක පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකමක් නොමැති වුවද රෝහල විසින් මෙම නිලධාරියා වෙත 2021 ජුලි 28 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 5.66ක් සහ 2023 සැප්තැම්බර් 30 දක්වා වැඩ ආවරණය කිරීමේ දීමනා ලෙස රු.775,170ක් ලෙස එකතුව රු.මිලියන 6.43ක මුදලක් ආයතන සංග්‍රහයට පටහැනිව ගෙවා තිබුණි. වැඩ ආවරණය කිරීමේ දීමනාව ගෙවීම 2023 ඔක්තෝබර් මස සිට අත්හිටුවා තිබුණු අතර එම මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණද මෙතෙක් ඒ අනුව කටයුතුකර නොතිබුණි. | රාජකාරී ආවරණය සඳහා දීමනාව ගෙවීම් කිරීම 2023 ඔක්තෝබර් සිට අත්හිටවන ලද බව හා වැඩිපුර ගෙවූ දීමනාව අයකර ගන්නා ලෙස ගිණුම් අංශයට දන්වන ලද නමුත් හිටපු සභාපතිතුමාගේ උපදෙස් මත එම අයකිරීම නතර කරන ලද බව. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) රෝහලේ ස්ථිර කාර්යමණ්ඩලයේ නිත්‍ය රාජකාරියක් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීම හැර වෙනත් රාජකාරියක් පවරා තිබුණු බව තහවුරු කර ගැනීමට රාජකාරී ලැයිස්තුවක් ලබා දී නොතිබියදී යථෝක්ත කාලපරිච්ඡේදය වෙනුවෙන් අමතර රාජකාරී දීමනා ලෙස රු.මිලියන 4.77ක් ගෙවීම් කිරීම හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2015 පරිදි වෙන්කල වාහනයක් භාවිතා කිරීමට හිමිකමක් නොමැති මෙම නිලධාරී වෙත ඉන්ධන දීමනා ලෙස රු.මිලියන 1.28ක් ගෙවීම් කර තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය. | මේ වන විට රාජකාරී ලැයිස්තුවක් ලබා දී ඇති බව, චක්‍ර ලේඛය අනුව මෙම නිලධාරියාට වෙන්කල වාහනයක් භාවිතා කිරීමට හිමිකමක් නොමැති බැවින් ගෙවන ලද ඉන්ධන දීමනාව නතර කොට, එම චක්‍රලේඛයෙහි 4 ඡේදයට අනුව 2024 පෙබරවාරි 03 දින සිට නිවසේ සිට රාජකාරී ස්ථානය දක්වා යාමට හා ඒමට සංචිතයේ වාහනයක් සහ රියදුරකු අනුයුක්ත කලද ගමන් වාර 4ක් ධාවනය කිරීම නිසා වැඩි පිරිවැයක් දැරීමට සිදු වන බව දන්වා එම වාහනය ඔහු විසින් ධාවනය කිරීමටත් එය රාත්‍රියේ ඔහුගේ නිවසේ රඳවා ගැනීමටත් හිටපු සභාපතිතුමාගේ අනුමැතිය ලබා ගෙන ඇතිබව. | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ගෙවන ලද දීමනා අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව ස්ථිර නිලධාරියෙකු පත්කරනතෙක් තාවකාලික වශයෙන් මෙම වැඩ ආවරණය කිරීමේ පත්වීම ලබාදී තිබුණද මේ වනවිට වර්ෂ 2 ½ කට අධික කාලයක් සේවයේ යොදවා තිබුණු අතර ස්ථිර පදනමින් පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනිම සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ පටිපාටියද අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කොට ඇති බව හා නව බඳවා ගැනීමේ පටිපාටි අනුමත කරන තුරු හිටපු සභාපතිතුමාගේ වාචික උපදෙස් මත තාවකාලිකව නවතා ඇතිබව. | ස්ථිර පදනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රෝහල සඳහා බඳවාගැනීමේ පරිපාටියක් සකස් කිරීමේ කාර්යය 2023 අප්‍රේල් 27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් කමිටුවක් වෙත පවරා සමාලෝචිත වර්ෂය තුළ කමිටුව වෙත රු.518,000ක මුදලක් ගෙවා තිබුණු අතර විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව තනතුරු 84 කට අදාලව බඳවාගැනීමේ පරිපාටි පිළියෙල කර ඇතත් අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එසේම බඳවාගැනීමේ පරිපාටි 12 කට අදාලව වැටුප් කේතවල නොගැලපීම් හේතුවෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට නොහැකිවී තිබුණි. | බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීමට පත් කල කමිටුව විසින් සියළුම බඳවා ගැනීමේ පරිපාටි කෙටුම්පත් සකසා ඇතිබව හා එම කෙටුම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා අනුමත කරවා ගෙන ඉදිරි කටයුතු සිදුකරන බව. | බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දින වනවිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා තනතුරු 03ක් සඳහා නිලධාරීන් 266දෙනෙකු හා අනුමත කාර්යමණ්ඩලය තුළ නොවූ එක් තනතුරක් සඳහා නිලධාරීන් 04 දෙනෙකු පත්කර තිබුණි. | මෙම රෝහලේ කලමනාකරණ සහකාර නිලධාරීන්, ඕඩර්ලි සහ සෞඛ්‍ය කාර්ය සහායක කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී කේත වෙනස් වීම හේතුවෙන් මෙම ගැටළුව පෙන්නුම් කරන බව හා Phlebotomist තනතුර මෙතෙක් අනුමත වී නොමැති බව. | බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | රෝහල් සේවයෙන් 2020 අප්‍රේල් 24 දින විශ්‍රාම ගිය පරිපාලන නිළධාරි වෙත රු.284,784ක දඩ මුදලක් ද සහිතව එකතුව රු.මිලියන 2.18ක පාරිතෝෂිකයක් ගෙවීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය. | | |
| (i) | මෙම නිලධාරියාගේ පත්කිරීම හා වැටුප් ගෙවීම සහ තනතුරු නාම අනුමත කර නොගැනීම හා මානව සම්පත් ප්‍රධානී තනතුරේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් දීමනා ගෙවීම සම්බන්ධයෙන් පිළිවෙලින් 2017 හා 2020 වර්ෂයන්හිදී විගණනය විසින් අවස්ථා 02කදී විගණන විමසුම් නිකුත් කර තිබියදී මූලික විමර්ශනය සඳහා නිලධාරියෙකු පත්කර තිබුණේ නිලධාරියා විශ්‍රාමයාමට නියමිතව තිබූ දිනයට පෙර දිනදීය. මේ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදුකල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙම පරීක්ෂණය මූලික විමර්ශණයක් නොවන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරන ලද ඒක පුද්ගල පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඔහුගේ නිරවුල් සහතිකය ලබා ගැනීමේ දී ඇතිවූ ගැටළුවක් නිරාකරණය කර ගැනීමට කරන ලද පරීක්ෂණයක් බව. | කඩිනමින් විධිමත් පරිදි විනය හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කළ යුතුය. |
| (ii) | මූලික විමර්ශනයට අනුව වැරදි ලෙස උපයාගත් වැටුප් ලෙස ගණනය කරන ලද රු.මිලියන 1.17ක මුදලක් හා විගණන විමසුම ප්‍රකාරව මානව සම්පත් ප්‍රධානී තනතුරේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් වැරදි ආකාරයට ගෙවූ දීමනා ලෙස අයවිය යුතු මුදල රු.මිලියන 1.58ක් ලෙස එකතුව රු.මිලියන 2.75ක් එම නිලධාරියාගෙන් අයකරගත යුතු බව දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දීමනා ලෙස ගෙවූ මෙම මුදල අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කලද කම්කරු උසාවියේ එම මුදල තැන්පත් කරන ලෙසට දන්වා තිබුණු බව හා අදාල මුදල අයකර ගැනීමකින් තොරව උසාවිය එම මුදල නිදහස් කළබව. | එම |

| | | |
|---|---|---|
| (iii) නිලධාරියාගෙන් අයවිය යුතු මුදලට හිලව් කර ගැනීමේ අරමුණින් ඔහුගේ පාරිතෝෂික මුදල රඳවාගෙන තිබුණද අදාල නිලධාරියා විසින් කම්කරු කොමසාරිස් වෙත පැමිණිලි කිරීමෙන් පසු මහේස්ත්‍රාත් උසාවියේ නඩු පවරා තිබුණු අතර එම නඩුවට අදාල නඩු ලිපිගොණුවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව අදාල නිලධාරියා වෙත රු. 284,784ක දඩ මුදලක්ද සහිතව එකතුව රු.මිලියන 2.18ක පාරිතෝෂික මුදලක් ගෙවා තිබුණි. කළමනාකරණය විසින් කඩිනම් විනය හා නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් වැරදි ලෙස ගෙවූ වැටුප්, දීමනා හා පාරිතෝෂික අධිභාර ඇතුළුව රු.මිලියන 3.04 ක් ගෙවීමට සිදුවී ඇතිබව විගණනයේදී නිරීක්ෂණය විය. | අදාල ලිපි ගොණුව විගණනයට එම ඉදිරිපත් කරන බව. | |

**3.4 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සතුව වාහන 16ක් තිබුණු අතර එම වාහන සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය. | | |
| (i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ජාතික අයවැය චක්‍රලේඛ අංක 150 අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් රෝහල වෙත ලබාදී තිබුණු වාහන 06ක් රෝහල වෙත ලැබී වසර 7 ක කාලයක් ඉක්මවා තිබුණද විගණිත දින දක්වා එම වාහන ආයතනයේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන වල අයිතිය පවරා ගැනීමට අදාල ලිපි හා පැවරීම පිළිබඳ ප්‍රකාශ සෞඛ්‍ය අමාතංශය වෙත ලිඛිතව දැනුම් දී ඇතිබව හා අදාල අංශ වෙත සිහි කැඳවීම් ලිපි යොමු කිරීමට කටයුතු කර ඇති බව. | වාහන අප්‍රමාදව පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) හදිසි අනතුරකට ලක්වී තිබුණු මෝටර් රථය සම්බන්ධයෙන් මු.රෙ. 104 (1) ප්‍රකාරව මූලික විමර්ශනයක් පවත්වා වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණු අතර අනතුර සිදුවීමෙන් වර්ෂ දෙකකට වැඩි කාලයක් ඉක්මවා අළුත්වැඩියා කටයුතු සඳහා යොමුකිරීම හේතුවෙන් රක්ෂණ ආයතනය විසින් හානි පූර්ණය කර නොතිබුණි. අළුත්වැඩියාව සඳහා පුද්ගලික සමාගමක් විසින් රු. 489,200ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද, ඊට අනුව අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු නොවීමෙන් වාහනයට හානි සිදුවී තිබුණු අතර අදාල සමාගම රු.මිලියන 1.73ක නව ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. අත්තිකාරම් ලෙස රු. 97,840ක් ගෙවා තිබුණද නිසි කාලසීමාවන් තුළ වාහනය අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් විශාල වියදමක් දැරීමට සිදු වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්වය පැවැති කාලය තුල ගරාජ වසා තිබීම, ප්‍රසම්පාදන කමිටුවලින් තීරණ ගැනීම ප්‍රමාද වීම, ඉදිරිපත් කල මිලගණන් අධික වීම හේතුවෙන් අනුමත නොවීම මත අධ්‍යක්ෂ මණ්ඩල දැනුම් දීම අනුව ප්‍රවාහන අමාත්‍යාංශයේ අනුමැතිය ලත් ලක්දිව ඉංජිනේරු සමාගමෙන් අළුත්වැඩියා කටයුතු සිදු කළ බව, නියමිත කාල සීමාව තුළදී අලුත්වැඩියා කටයුතු සිදු කර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් රක්ෂණ වන්දි ලබා ගත නොහැකිවූ බව. | දෝෂ නිවැරදිව හඳුනාගෙන කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (i) | 2021 මැයි මාසයේ සිට ධාවනයෙන් ඉවත්කර තිබුණු ගිලන් රථයක් 2022 පෙබරවාරි මස අළුත්වැඩියාව සඳහා යොමුකර තිබුණු අතර එම ගිලන් රථය අළුත්වැඩියාව සඳහා සමාලෝචිත වර්ෂය තුළ රෝහල විසින් රු.මිලියන 1.2ක් වැයකර තිබුණද වායු සමීකරණ පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම, පිටුපස දොර අබලන් තත්ත්වයේ පැවතීම හා රථයේ අභ්‍යන්තරය රෝගීන් ප්‍රවාහනයට සුදුසු තත්ත්වයක නොපැවතීම හේතුවෙන් ගිලන් රථයක් ලෙස රෝහලේ කටයුතුවලට යොදවා ගැනීමට නොහැකි වී තිබුණි. | ආයතනය විසින් එන්ජිමට අදාල දෝශ පමණක් අලුත්වැඩියා කර ඇති බව, ගිලන් රථය බොහෝ කාලයක් ගරාජය තුල නවතා තිබීම සහ එන්ජිම සම්පූර්ණයෙන් ගලවා අලුත්වැඩියා කිරීම හේතුවෙන් ඇතුළත අපිරිසිදු වීම සහ වායු සමීකරණ පද්ධතිය අක්‍රිය වීමද සිදු වී ඇති බව. | එම. |